

## සොබා දහමේ අපූරු දායාදය

# සෙංකඩගල රාජධානිය

ශ්‍රී ලංකා ඉතිහාසයෙහි ඉතා වැදගත් හා අවසාන රාජධානිය ලෙස හඳුනාගත හැක්කේ සෙංකඩගල රාජධානිය හෙවත් කන්ද උඩරටයි. දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන මෙම රාජධානියෙහි ස්වභාවික පිහිටීමට දැඩි ආරකෂිත මුහුණුවරක් නිර්මාණය කළේය.

මධ්‍ය කඳුකරයේ කඳු වළල්ලකට මැදිව මුහුදු මට්ටමේ සිට මීටර් 488.6 (අඩි 1629) තරම් උස් වූ බිමක් ලෙස වඩා ජනප්‍රිය මහවැලි මිටියාවතෙහි මෙය පිහිටා ඇත. කඳුරට හැඳින්වූයේ ලමලයල නමිනි. විටක මලය මණ්ඩලය හෝ තවත් අවස්ථාවල මලය දේශය ලෙස හඳුන්වයි. වියවුල් සහගත කාලයන් හි රජුන්ට සතුරන්ගෙන් මිදී රැකවරණය ලබාගැනීමටත් සිය බලමුළු නැවත ප්‍රතිසංවිධානය කර නැවත බලය ස්ථාපිත කිරීමට උපකාරි වූ තෝතැන්නක් විය. කළු ගඟටත් දැදුරු ඔයටත් අතර වූ මධ්‍යම කඳුකර භූමි ප්‍රදේශයට බටහිරින් පිහිටි සාරවත් පහත් බිම් ප්‍රදේශය මායා රට නමින් හඳුන්වා ඇත.

බ්‍රාහ්මී ශිලා ලේඛන පිළිබඳ විග්‍රහකර බැලීමේදී මහනුවර හා එහි උපනගර ක්‍රිස්තු වර්ෂය ආරම්භ වන විට ජනාවාසව පැවති ආකාරය වේගිරිය , දුල්වල, මොලගොඩ, ගොනවත්ත හා බඹරගල යන ශිලා ලේඛනවලින් පැහැදිලි වේ. මේ තුළින් පැහැදිලි වන්නේ දීර්ඝ ඉතිහාසයකට සෙංකඩගල රාජධානිය උරුමකම් කියනු ලබන බවයි.

රාජ්‍යයක භෞමික පිහිටීම එහි ආරකෂාව තහවුරුවීම පිණිස බෙහෙවින් උපකාරී වේ. එවැනි තත්වයක් තුළ විශේෂයෙන් උඩරට රාජ්‍ය කෙරෙහි අවධානය යොමු කරනවිට මෙම සංකල්පය



රොබර්ට් නොක්ස්

වඩාත් පැහැදිලි වේ. උඩරට රාජධානියේ පැවැති ස්වභාවය පිළිබඳ කරුණු දැක්වූ රොබට් නොක්ස් උඩරට සම්බන්ධයෙන් ඔහුගේ ආකල්පය මෙසේ පෙන්වා දී තිබේ.

"කන්ද උඩරට රාජධානිය ස්වභාව ධර්මයාගේ පරිත්‍යාගය සම්බන්ධයෙන් විශිෂ්ට සාධකයකි. එය පරසතුරෙකුට ඇතුළුවිය නොහැකි ලෙසත්, පරසතුරෙකු විසින් බිඳ හෙලිය නොහැකි ලෙසත් පර්වත ප්‍රාකාර හා බලවලවලින් හාත්පසින්ම වටවූවා වැන්න............"

ඒ අනුව පැහැදිලි වන්නේ මහනුවර රාජධානය කිනම් ලෙස ස්වභාවික ආරකෂාව යටතේ පැවතියද යන්නයි. මධ්‍යම කඳුකරයේ මහනුවර සානුව තුළ පිහිටි මෙම රට නැගෙනහිරින්, උතුරින් හා බටහිරින් ස්වභාවික වශයෙන් මහැවැලි ගඟින් වටවී පිහිටා ඇත. විශේෂයෙන්ම මහවැලි ගංගාව මහනුවර සානු හරහා වක්‍රාකාරව ගමන් කරන බවයි. හන්තාන කඳු වළල්ල පවතින බැවින් උඩරට රාජධානියෙහි දැඩි මූරකාවල් සහිත බලකොටුවක් වූ අතර, ආක්‍රමණිකයකුට මෙම ස්ථානය කරා ළඟාවීමට පහසුවෙන් නොහැකිවිය.
මහනුවරට ඇතුළුවිය යුත්තේ දුර්ගමාර්ගයන්

> **"කන්ද උඩරට රාජධානිය ස්වභාව ධර්මයාගේ පරිත්‍යාගය සම්බන්ධයෙන් විශිෂ්ට සාධකයකි. එය පරසතුරෙකුට ඇතුළුවිය නොහැකි ලෙසත්, පරසතුරෙකු විසින් බිඳ හෙලිය නොහැකි ලෙසත් පර්වත ප්‍රාකාර හා බලවලවලින් හාත්පසින්ම වටවූවා වැන්න............"**

තුළින් නිසා දැඩි ආරක්ෂාවක් තිබුණි. මෙයට ඇතුල්වීම සඳහා පැවැති ගිරිදුර්ග පිළිබඳ විමසීමේදී බටහිරින් බලන කපොල්ල හා කඩුගන්නාව දුර්ගයත්, වයඹ දෙසින් ගලගෙදර දුර්ගයත්, උතුරින් බලකඩුව දුර්ගයත් පිහිටා ඇත. රාජ්‍යයට දකුණු දෙසින් හැටන් සානුව හරහා පැමිණීමට පෙර ගිනිගත්හේන කපොල්ල තරණය කර පැමිණීම අනිවාර්ය විය. මෙම ආරකෂක කපොලු බොහෝදුරට තරණය කිරීම ආගන්තුක පිරිසකට තරමක් අමාරු විය.

සෙංකඩගල රාජධානියට දැඩි ආරකෂාවක් ලබාදුන් දුර්ග මාර්ගයක් ලෙස බලන කපොල්ල හඳුනාගත හැකිය. එහි දක්නට ඇති පුරාවිද්‍යාත්මක නටඹුන් මගින් එම කාලයේ කිනම් වැදගත් භාවයක් හිමි කරගත්තේද යන්න අවබෝධ වේ. මුහුදු මට්ටමේ සිට අඩි 2000 කට ආසන්න ස්ථානයක බලන කොටුව පිහිටා ඇත. කොළඹ සිට පැමිණෙන යම් ආක්‍රමණකාරී පිරිසක් අනිවාර්යයෙන්ම කඩූගන්නාව හෝ බලන කපොලු තරණය කළ යුතුය. මෙම ස්ථානයේ ස්වභාවික පිහිටීම කාල වේලාව ඇතිව දුර සිට එන සතුරු සේනාවල් හඳුනාගත හැකිය. පිහිටා තිබීමේ වැදගත්කමේ වාසිය වූයේ කඳු මුදුන්වල සිට සතුරාට දැඩි ලෙස පහරදීමට හැකිවීමය. ක්‍රි. ව. 1602 දී දොන් ජෙරෝනිමෝද අසවේදා උඩරට ආක්‍රමණය කිරීමට ගොස් අන්ත පරාජයට පත්විය. මෙහිදී ඔහුට බලන කොටුව පවා පසුකිරීමට නොහැකි විය. වංශකතාවන්ට අනුව උඩරට ආක්‍රමණය සඳහා පැමිණි පෘතුගීසි හමුදාවේ සිටි සිංහල සේනා බොහෝදුරට ඔවුන් අතහැර සිංහල හමුදාවට එක්වූ ස්ථානයක් ලෙස බලන කොටුව ප්‍රසිද්ධය.

කන්ද උඩරට රාජධානියෙහි ආරක්ෂාව සඳහා දැඩිව උපකාරි වූ අංගයක් වූයේ වානාන්තරයන්ය. දැඩි වනගහනයක් යටතේ පැවතීම නිසා පහසු මාර්ගයකින් උඩරටට ළඟාවීමට නොහැකි විය. එවකට උඩරට සිහසුනෙහි බලයලත් පාලකයන් නිරතුරුවම වනාන්තර ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාකර තිබේ. මේ සම්බන්ධයෙන් රොබට් නොක්ස් මෙසේ කියයි.

"සෑම ප්‍රදේශයකම ඝනව වැඩීගිය වනාන්තරවලින් මායිම් වී ඇති අතර ප්‍රදේශ ආරකෂාව පිණිස පවත්වන මෙම කැලෑ කපා දැමීම රාජ නීතියෙන් තහනම් වන්නේය. වනාන්තරය රැකීම සඳහා මහරජු විසින් පත්කරන ලද වන ආරකෂක නිලධාරිහු වෙති. වනගහණය රක්ෂා කරගැනීම එතරම්ම වැදගත් වූයේය."

තවද මහවැලි ගඟ තරණය කර උඩරට රාජ්‍යයට ඇතුල්විය හැකි ස්ථානයක් ලෙස ගන්නෝරුව වැදගත් විය. ජන ව්‍යවහාරයෙහි ගන්නෝරුව මිටියාවත ලෙසද හඳුන්වයි. මෙය උඩරට රාජධානිය සම්බන්ධ සිදුවීම්වලදී සටන් සඳහා ප්‍රමුඛ ස්ථානයකි. පෘතුගීසීන්ට දැඩි ප්‍රහාර එල්ල කිරීම පිණිස සිංහලයන් විසින් මෙම ස්ථානය භාවිතා කර තිබේ. ලංකා ඉතිහාසයෙහි ගන්නෝරු සටන ඉතා වැදගත් සිදුවීමකි. විශේෂයෙන්ම පේරු ලෝපේස් ද සූසා, දියෝගු ද මේලෝ ඇතුළු ප්‍රතිකාල් හමුදාව අන්ත පරාජයට පත්වූයේ මේ ස්ථානයේදීය. ඒ සඳහා උපකාරී වූයේ උඩරට රාජ්‍යයට අයත් ප්‍රදේශයක් ලෙස මෙහි පැවති ස්වභාවික පිහිටීමයි.

මහනුවර රාජධානියේ ස්වභාවික ආරකෂාව සනිටුහන් කිරීමට පැවැති පාරිසරික තත්ත්වයද බෙහෙවින් උපකාරි විය. විශේෂයෙන් කාලගුණික වශයෙන් ඇතිවන විපර්යාස පිළිබඳ සතුරු සේනාහට නිවරදි අවබෝධයකින් තොරව ක්‍රියා කිරීම නිසා විනාශ වූ ආකාරය පෙනී යයි. මහවැලි ගඟ උතුරා ගියවිට පසුබැසීමේ මාර්ග අවහිර වන නිසා කඳුකරයේ සිට ක්‍රමයෙන් සතුරාට ළඟා වී දැඩි ප්‍රහාරයක් දීමට හැකිවිය. විශේෂයෙන් ගන්නෝරුව මිටියාවතට බටහිරින් වයඹ හා දිසාගතව විහිදී ඇති ගන්නෝරුව කන්දත්, මහවැලි ගඟත් නිසා සිංහලයන් හට පහසුවෙන් සතුරන් පරාජය කිරීමට හැකි විය. ස්වභාවික බල කඳවුරක් ලෙස ගන්නෝරුව ප්‍රදේශයේ පිහිටීම ඉතා වැදගත් විය.

අප මෙතෙක් දුරට සාකච්ඡා කරනු ලැබූවේ උඩරට රාජධානියේ ජයග්‍රහණය තහවුරු කිරීම පිණිස උඩරට පිහිටි ස්වභාවික පිහිටීම පිළිබඳවය. එනමුත් මහාචාර්ය ටිකිරි අබේසිංහ මහතා



පෙන්වා දෙන්නේ (1602 * 1603* 1611 * 1628 * 1630 * 1638) යන වර්ෂවලදී පෘතුගීසීන් විසින් උඩරට සඳහා දැඩි බලපෑමක් සිදුකොට ඇති බවය. එහෙත් බොහෝදුරට උඩරට රාජ්‍යයෙහි ආරකෂාව ස්වභාවික පිහිටීම මගින් තහවුරු විය. විශේෂයෙන්ම ක්‍රි. ව. 1803 උඩරට රාජධානිය සර් පෙඩ්‍රික් නෝත් ආණ්ඩුකාර තුමාගේ නායකත්වයෙන් උඩරට ආක්‍රමණය සිදු කළද නිවරදි අවබෝධයක් නොමැතිකමින් ඔවුන් අන්ත පරාජයට පත් විය. නමුත් පසුකාලයේ බලයට පැමිණි ආණ්ඩුකාරතුමා උඩරට රාජධානියේ ස්වභාවික පිහිටීම අවබෝධ කරගනිමින් හදිසි පහරදීමකදී පසුබැසීම සඳහා මාර්ග පද්ධතියක් ගොඩනගා රට අභ්‍යන්තරයේ පැවැති දේශපාලන වියවුල් ප්‍රයෝජනයට ගනිමින් ක්‍රි. ව. 1815 උඩරට ආක්‍රමණය කළේ ය. ඇත්ත වශයෙන්ම මෙම-ගින් උඩරට පරාජය වූ අතර, එමගින් මෙතෙක් කල් උඩරට හිමිකරගෙන තිබූ ස්වාධීනත්වය යටපත් විය.

විශේෂයෙන්ම දුටුගැමුණු (ක්‍රි. පූ. 161 * 137) වට්ටගාමිණී (ක්‍රි. පූ. 103 * 89) සිලාකාල (ක්‍රි. ව. 518 * 531) සිලාකාල (ක්‍රි. ව. 517 * 518) හයවැනි අග්‍රබෝධි (ක්‍රි. ව. 732 * 772) දප්පුල (ක්‍රි. ව. 815 * 831) පළමු විජයබාහු (ක්‍රි. ව. 1055 * 1110) ආදී පාලකයන් යම් යම් කාලවලදී උඩරට රාජධානිය රකෂිත ස්ථානයක් ලෙස තෝරාගැනීමට හේතු වූයේද ස්වභාවික පිහිටීම ය. ස්වභාවික පිහිටීම රාජ්‍යයක ආරක්ෂාව තහවුරු කිරීම පිණිස බෙහෙවින් උපකාරි වන බව මේ අනුව පෙනී යයි.

අජිත් තලවත්ත